කලාප අධ්‍යාපන කාර්යාලය - කොළඹ
வலயக் கல்வி காரியாலம் - கொழும்பு
Zonal Education Office - Colombo
දෙවන වාර පරීක්ෂණය - 2024
இரண்டாம் தவணை பரீட்சை - 2024
Second Term Test - 2024

| 8 ශ්‍රේණිය | ගණිතය- I , II | කාලය : පැය 02 |
|---|---|---|


නම : ................................................................. විභාග අංකය : .....................................

**I කොටස**

- **1 සිට 20 තෙක් ප්‍රශ්න සියල්ලටම මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.**
- **එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් හිමි වේ.**

01) 3, 6, 9,12,.......,....... රටාවේ ඊළඟ පද දෙක ලියා සාධාරණ පදය ලියන්න.


02) රූපයේ පරිමිතිය සොයන්න.




03) රූපයේ AOB සරල රේඛාවකි. $A\hat{O}C = 90^0$ වේ. $D\hat{O}B$ හි

I. අනුපූරක කෝණය නම් කරන්න…........................................

II. පරිපූරක කෝණය නම් කරන්න…......................................




04) ( - 4) – ( - 6) අගය සොයන්න. ........................


05) a = 3 හා b = -2 වන විට 2(a- 3b) හි අගය සොයන්න.

06) ප්ලේටෝ කැට දෙකක් නම් කරන්න. I. .........................................................

II. .........................................................

07) a + ab + abc ප්‍රකාශනයෙහි සාධක සොයන්න.


08) අගය සොයන්න. $\sqrt{(2 \times 3)^2}$

| |
|---|
| 09) 6500 kg මෙට්‍රික් ටොන් වලින් දක්වන්න. |
| 10) 2 x 3 x 3 x 2 x2 x 3<br>I. බලයන්ගේ ගුණිතයක් සේ දක්වන්න. ..........................................................................................<br>II. ගුණිතයක බලයක් සේ දක්වන්න. .................................................................................................. |
| 11) සමාන්තරාස්‍රයක,<br>I. ද්විපාර්ශ්වික සමමිති අක්ෂ ගණන කීයද? .........   II. භ්‍රමක සමමිති ගණය කීයද?.............. |
| 12) x හි අගය සොයන්න.  |
| 13) සුළු කරන්න. $2\frac{1}{2} \times \frac{4}{5} \div \frac{2}{3}$ |
| 14) 1.42 x 0.3 හි අගය සොයන්න. |
| 15) අඹ හා කෙසෙල් 3 : 5 අනුපාතයට ද කෙසෙල් හා ගස්ලබු 2 : 1 අනුපාතයට ද මිශ්‍රකර සෑදූ පළතුරු සලාදයක අඹ කෙසෙල් ගස්ලබු මිශ්‍ර වී ඇති අනුපාතය සොයන්න. |
| 16) $\frac{x}{3} - 2 = 1$ විසඳන්න. |
| 17) බස් ගාස්තු 12% කින් ඉහළ ගියේ නම් කලින් රු. 150 ක ප්‍රවේශ පත්‍රයක් සඳහා නව ගාස්තු යටතේ වැඩිපුර ගෙවීමට සිදුවන මුදල කොපමණ ද? |
| 18) සමචතුරස්‍රයක පරිමිතිය 24 cm නම් එහි වර්ගඵලය සොයන්න. |
| 19) B = { 2, 4, 6, 8, 10} නම් සුදුසු පරිදි " අවයවයක් වේ " හෝ " අවයවයක් නොවේ " යන්න සඳහා භාවිත වන සංකේත පහත හිස්තැන් මත යොදන්න.   I. 3 .............. B   II. 6 .............. B |
| 20) (- 4) කාල කලාපයෙහි පිහිටි බටහිර ඉන්දීය කොදෙව් දූපතක වේලාව 21: 30 නම් + 3 කාල කලාපයෙහි පිහිටි කෙන්යාවේ නයිරෝබි වල වේලාව කීය ද? |

**II කොටස**

- **පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු ලියන්න.**
- **පළමු ප්‍රශ්නයට ලකුණු 16ක් ද අනෙක් ප්‍රශ්න සඳහා එක් ප්‍රශ්නයකට ලකුණු 11 බැගින් ද හිමි වේ.**

(01)




a) පහත දැක්වෙන රූපය ඇසුරෙන් පිළිතුරු සපයන්න.

I. ත්‍රිකෝණය නම් කරන්න.

II. බාහිර කෝණය හා PRQ කෝණය අතර සම්බන්ධය සමීකරණයකින් ලියන්න.

III. එනයින් PRQ කෝණය $60^0$ විට බාහිර කෝණයේ අගය සොයන්න.

IV. PRQ, QPR හා PQR කෝණවල විශාලත්වයන් සම්බන්යෙන් වන සම්බන්ධතාවයක් සමීකරණයක් ලෙස දක්වන්න.

V. PRQ හා PQR කෝණවල විශාලත්වයන් සමාන වේ නම්, ඉතිරි කෝණයේ අගය සොයන්න.

(ලකුණු 02 x 05 = 10)

b)

I. සෘජුකෝණාස්‍රයක දිග හා පළල අතර අනුපාතය 3 :1 වේ. පළල x ලෙස ගෙන එහි පරිමිතිය සඳහා වීජීය ප්‍රකාශනයක් ලියන්න.

II. එහි පරිමිතිය 32cm නම්, x හි අගය සොයන්න.

III. එම සෘජුකෝණාස්‍රයේ වර්ගඵලය සොයන්න.

(ලකුණු 02 x 03 = 06)

(02)

a)

I. ස්කන්ධය 300kg ක් වූ වාහනයකට ස්කන්ධය 60kg ක් වූ මගීන් දෙදෙනෙක් 50kg ක් බැගින් වූ ගමන් මලු ද රැගෙන නැග්ගේ නම් වාහනයේ මුලු ස්කන්ධය සොයන්න.

II. සහල් ගබඩාවක සහල් 25t ගබඩාකර ඇත. එම සහල් 10 kg පැකට් වලට අසුරයි නම් ඇසිරිය හැකි පැකට් ගණන කීයද?

III. එම සහල් බෙදාහැරීම සඳහා උපරිම වශයෙන් 2000 kg ඇරිය හැකි ලොරි රථ යොදා ගන්නේ නම් ගබඩාවේ සහල් පැකට් එකවර ප්‍රවාහනය කිරීම සඳහා අවශ්‍ය ලොරි රථ ගණන කීයද?

(ලකුණු 02 x 03 = 06)

b) දී ඇති රූපය ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න


I. X හි අගය සොයන්න.

II. $A\hat{O}C$ අගය කීයද?

III. $A\hat{O}C$ ට පරිපූරක බද්ධ කෝණයක් ලියන්න.

IV. $B\hat{O}G$ ට අනුපූරක කෝණයක් ලියන්න.

V. $D\hat{O}E$ හි අගය කීයද?




(ලකුණු 01 x 05 = 05)

(03)

a) නාරං ගෙඩියක මිලට වඩා ඇපල් ගෙඩියක මිල රු. 20 කින් වැඩිය.

I. නාරං ගෙඩියක මිල රු. a නම් ඇපල් ගෙඩියක මිල සඳහා ප්‍රකාශනයක් a ඇසුරෙන් ලියන්න.(ලකුණු 01)

II. ඇපල් ගෙඩි 5ක මිල රු. 600 ක් නම් දොඩම් ගෙඩියක මිල සෙවීම සඳහා a ඇසුරෙන් සරල සමීකරණයක් ගොඩනගන්න. ( ලකුණු 02 )

III. එනයින් දොඩම් ගෙඩියක මිල සොයන්න. ( ලකුණු 03 )

b) A = { "COLOMBO" යන වචනයේ අකුරු }

I. A කුලකයේ අවයව සියල්ල සඟල වරහන් තුළ ලිවීමෙන් ලියා දක්වන්න.

II. n(A) හි අගය කීයද? (ලකුණු 01 x 02 = 02)


c) B = { "2864" යන සංඛ්‍යාවේ ඇති ඉලක්කම් යොදා ගෙන සෑදිය හැකි ඔත්තේ සංඛ්‍යා } නම්

I. B කුලකයේ අවයව සියල්ල සඟල වරහන් තුළ ලිවීමෙන් ලියා දක්වන්න.

II. n(B) හි අගය කීයද?

III. B කුලකය ......................... කුලකයක් ලෙස හැඳින්වේ. (හිස්තැන පුරවන්න.) (ලකුණු 01 x 03 = 03)

(04)




a) දී ඇති රූපයේ ;

I. පරිමිතිය සොයන්න. (ලකුණු 02)

II. ත්‍රිකෝණාකාර කොටසේ වර්ගඵලය සොයන්න. (ලකුණු 02)

b) සුළු කරන්න. පිළිතුර සරලව දක්වන්න.

I. $\frac{5}{6} + 2\frac{1}{4}$ (ලකුණු 02)

II. $\frac{7}{8} - \frac{1}{4}$ (ලකුණු 02)

III. $3\frac{1}{2} \div 1\frac{3}{4} \times \frac{1}{6}$ (ලකුණු 03)

(05)

a) මිනිසකු සතු ඉඩමක විශාලත්වය හෙක්ටයාර 4 කි. ඔහු තම ඉඩමෙන් බාගයක් තම පුතුට ද පුතාට දුන් ප්‍රමාණයෙන් හරි අඩකට සමාන ප්‍රමාණයක් තම දුවට ද දෙන ලදි.

I. පුතාට දෙන ලද බිම් ප්‍රමාණය හෙක්ටයාර කීයද?

II. දුවට දෙන ලද බිම් ප්‍රමාණය හෙක්ටයාර කීයද?

III. ඔහුට ඉතිරි වූ බිම් ප්‍රමාණය මුළු ඉඩමේ ප්‍රතිශතයක් ලෙස දක්වන්න. (ලකුණු 02 x 03 = 06)

b) පහත සඳහන් සරල සමීකරණ විසඳන්න.

I. $\frac{1}{3}(x - 4) = 2$ (ලකුණු 02 )

II. $2(\frac{5x}{2} + 1) = -18$ (ලකුණු 03 )

(06)

a) එක්තරා වර්ෂයක අගෝස්තු මාසයේ සඳුදා දිනෙක (-8) කාල කලාපයේ පිහිටි ඇමෙරිකාවේ ලොස් ඇන්ජලීස් නගරයෙහි වේලාව පැය 11:30 වේ.

I. එවිට ග්‍රිනිච් නගරයේ වේලාව කීයද? (ලකුණු 01)

II. එවිට ග්‍රිනිච් නගරයට සතියේ කුමන දවස උදාවී තිබේ ද? (ලකුණු 01)

III. එවිට +7 කාල කලාපයේ පිහිටි වියට්නාමයේ ෂැනොයි නගරයේ වේලාව කීය ද? (ලකුණු 02)

IV. වියට්නාමයේ ෂැනොයි නගරයට සතියේ කුමන දවස උදාවී තිබේ ද? (ලකුණු 01)

b) සෘජුකෝණාස්‍රයක් ඇඳ එහි සමමිති අක්ෂ ලකුණු කරන්න. (ලකුණු 01)

c) පහත දැක්වෙන වචන යොදා හිස්තැන් සම්පූර්ණ කරන්න.

( ඇත / නැත /රොම්බසයේ / හතර / දෙක / සෘජුකෝණාස්‍රයේ)

I. ............................... ද්විපාර්ශවික සමමිති අක්ෂ ගණන හා භ්‍රමක සමමිති ගණය ................. කි.

II. සමාන්තරාස්‍රයකට ද්විපාර්ශවික සමමිතිය ...............................

III. සමචතුරස්‍රයක සමමිති අක්ෂ .......................... කි.

IV. සවිධි බහුඅස්‍රයක භ්‍රමක සමමිතිය .................................. (ලකුණු 01 x 05 = 05)

(07)

a)

I. 15 ප්‍රථමක සාධකවල ගුණිතයක් ලෙස ප්‍රකාශ කරන්න.

II. 6, 12, 18 යන සංඛ්‍යා ත්‍රිත්වයෙහි මහා පොදු සාධකය සොයන්න. (ලකුණු 02 x 02 = 04)

b) 1, 3, 5, 7, …………… යන සංඛ්‍යා රටාවේ

I. සාධාරණ පදය කුමක් ද? (ලකුණු 01)

II. 20 වන පදය කුමක් ද? (ලකුණු 02)

III. 31, කී වැනි පදය ද? (ලකුණු 02)

c) (-3) – (+5) සංඛ්‍යා රේඛාව භාවිතයෙන් අගය සොයන්න (ලකුණු 02)

PARCEL NO

# LOL.lk BookStore



# විභාග ඉලක්ක පහසුවෙන් ජයගන්න

## ඕනෑම පොතක් ඉක්මනින් නිවසටම ගෙන්වා ගන්න



කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර | A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් | School Book ගුරු අතපොත්

PADANAMA PUBLICATION | pesuru Prakashana Private Ltd. | Akura Pilot | සමනල දැනුම | සතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර, කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා

## සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

**www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න**